# මූලධර්මවාදීන් ගෙන් ගැලවුණු බුදුනුවකු ගේ පාපෝච්චාරණය

### සාකච්ඡා කළේ දෙනගම සිරිවර්ධන

මාස දෙකක් තිස්සේ මහනුවර ක්‍රිස්තියානි මූලධර්ම කණ්ඩායමක් සමග රැඳී සිටි සිසිර ජයනාත් පීරිස් මහතා බෞද්ධ – හින්දු – කතෝලික ජනතාව මූලධර්ම කණ්ඩායම එකතු කර ගැනීමට ක්‍රියාත්මක කරන කූට උපක්‍රම මේ ලිපියෙන් හෙළි කරයි. මූලධර්ම කණ්ඩායම්වල පූජකවරු පාස්ටර් නමින් හැඳින්වෙති.

මහනුවර දළඳා වීදියේ පයින් ගමන් කරමින් සිටි මට මගේ නම කියා යම් කිසිවකු කතා කරනු ඇසිණ. මම හඬ ආ දෙසට හැරී බැලුයෙමි.

අලුත් වෑන් රියක් නතර කොට තිබිණ. එහි ඉදිරි අසුනේ සිනාමුසු ප්‍රිය ජනක මුහුණක් ඇති මහතෙක් මා දෙස බලා සිටී. මම රිය අසලට ගියෙමි.

"මතක නැද්ද මිස්ට ජයනාත්, අපි මොරටුවේ පැක්ටරියක වැඩ කළා. මෝටර් ස්පෙයා පාට්ස් හදන තැනක"

මට ඔහු සිහි විය.

ඔය සම්භාවනීය පෙනුම ඔහුට එදා තිබුණේ නැත. ඔහු සිටියේ සාමාන්‍ය කම්කරුවකු ගේ මට්ටමිනි. ඔහු අයත් වූවේ ඉතා දුප්පත් පවුලකට ය. ඒ කම්හලේ ඔහුට රැකියාව ලැබුණේ ද මා නිසා ය. මම ඔහුට වැඩ ඉගැන්වූයෙමි. ඒ 1960 ගණන් වල ය. මම එතැනින් ඉවත් වී විවිධ රැකියාවල යෙදුණෙමි. කලක් පිට රටවල සේවය කළෙමි. පසුව මහනුවර වානේ ගෘහ භාණ්ඩ නිපදවන කම්හලක කර්මාන්ත ශාලා කළමනාකාරවරයකු වශයෙන් සේවය කොට 2003 ජූනි මාසයේ විශ්‍රාම ලැබූයෙමි. අර මිත්‍රයාට සිදුවූයේ කුමක් දැයි මට දැනගන්නට නො ලැබිණ. ඔහු කසිප්පු බොන, වැරදි වැඩට යොමු වූ අයකු වශයෙන් පිරිහී ගිය ජීවිතයක් ගත කළ බව පමණක් මම ඇසුවෙමි. ඔහුගේ වෙනස, මට අදහාගත නොහැකි විය.

"මට මතකයි අවුරුදු කීයකට පස්සෙද දැක්කෙ. එක පාරට අඳුනගන්න බැරි වුණා," මම කීවෙමි.

"දැන් ජයනාත් මොකද කරන්නේ" ඔහු ඇසී ය.

"මම පැක්ටරියක මැනේජර් කෙනෙක් වෙලා හිටිය. දැන් විශ්‍රාම. නිකං ඉන්නවා."

"නිකං ඉන්න එපා. මම දන්නවා ජයනාත් කවුද කියලා. අපට වඩා දක්ෂයෙක්. හොඳ කථිකයෙක්, හොඳ සංවිධායකයෙක්. හොඳට කල්පනා කරල ඕනම වැඩක් කරන්න පුළුවන් කෙනෙක්. මං හිතුව ජයනාත් දැන් පැක්ටරියක අයිතිකාරයෙක් කියලා. මම සිනාසුණෙමි.

"මිස්ට ජයනාත්, මං උදව් කරන්නම්. මොකක් හරි කර්මාන්තයක් පටන් ගන්න. මං ඔළුව පාවිච්චි කරල දියුණු වුණා. මේ වාහනේ මගේ. තව වාහන තුනක් තියෙනවා. විශාල ගෙයක්, වත්තක් තියෙනවා. මෙන්න ඇඩ්‍රස් එක. වෙලාවක ගෙවල් පැත්තෙ එන්න. මේක තේ බොන්න තියා ගන්න..."

ඔහු මට රුපියල් පන්සීයක් දෙමින් කීය.තේ බොන්න රුපියල් පන්සීයක්? මට අදහාගත නොහැකි විය.

"මොරටුවේ දී කම්කරුවකු වූ ඔහු තේ බොන්න මට රුපියල් පන්සීයක් දුන්න... මම විස්මයට පත් වීමි. පසු දිනෙක ඔහු දුන් ලිපිනය අනුව ඒ නිවස සොයා ගියෙමි. සිරිමල් වත්තේ විශාල ගෙඋයනක පිහිටි ඒ මැදුරට පිවිසුණු මට මා දකින්නේ සිහිනයක් දැයි සිතිණි. ඒ තරමට ඔහු වෙනස් ය. ඔහු ගෙවන්නේ මහා සුඛෝපභෝගී ජීවිතයකි. ලොරියක් වෑන් රියක්, මෝටරියක් සහ යතුරු පැදියක් ඒ නිවස පසෙකින් නවතා තිබිණි.

මේ මිනිහා කුඩු බිස්නස් එකක්වත් කරනවද දන්නෙ නෑ. නැත්නම් කොහොමද පෝසත් වුණේ මට සිතිණි.

ඔහු මට ඉතා හොඳින් සංග්‍රහ කළේ ය. ඉස්සර මං මොරටුව පැක්ටරියෙ ඉන්න කාලෙ ජයනාත් මට උදව් කරලා තියනවා. ඒකට මං කළ ගුණ සලකන්න ඕන. ජයනාත් හොඳ කර්මාන්තයක් පටන් ගන්න. මම උදව් කරන්නම්.

ඔහුගේ කතාව අසන්නන්ගේ සිත් මෝහනයට පත් කරයි. මේ තරම් ආකර්ශනීය පෙනුමක් කතාවක් ඔහුට ලැබුණේ කොහොමද? ඉස්සර ඔහු සතුව පැවැති මුඩුම, තක්කඩි මරු මූස් පෙනුම දැන් නැත. මිනිස්සු වෙනස් වෙන හැටි මම සිතුවෙමි. කළ ගුණ දන්න මිනිහෙක්. මම ඔහු ගැන හොඳටම පැහැදුණෙමි. ඇත්තටම ඔහු ශාන්තුවරයෙක් වගෙයි.

"ජයනාත් ගෙ ශක්තිය ගැන ජයනාත් දන්නෙ නැහැ. මං උදව් කරන්නම්. මොකක්ද කරන්න පුළුවන්" ඔහු ඇසීය.

## කුලී පල්ලියක්

මුල ඉඳලම මං කළේ කර්මාන්ත වැඩ. මැලේසියාවෙත් හිටියා. එහේදි වැඩ කළේ නෙස්ලේ කොම්පැණියෙ. කර්මාන්ත කීපයක්ම මං දන්නවා. දන්තාලේප කර්මාන්තය මට පහසුවෙන් පටන් ගන්න පුළුවන්" මම කීවෙමි.

බොහෝම හොඳයි. දැන් ඒක පටන් ගන්න ක්‍රමය, අවශ්‍ය උපකරණ, අමුද්‍රව්‍ය, ඕවා සටහනක් හදන්න. කොපමණ මුදලක් යනවද බලන්න. මගෙන් වාහන ඩ්‍රයිවර්ල දෙන්නම්. ඔක්කොම විස්තර දැනගෙන ඇස්තමේන්තුව හදාගෙන ඉක්මනට එන්න."

මම නැගිට්ටෙමි.

බලන්න මේ වීඩියෝ චිත්‍රපටය. ඔහු මා වීඩියෝ චිත්‍රපටයක් නැරඹීමට කැඳවාගෙන ගියේය. අපි එය නැරඹූයෙමු. එය රූපගත කර තිබුණේ නයිජීරියාවේ දී ය.

රෝගීන්ට සුවය ලබා දෙන හාස්කම් තිබූ දර්ශන පෙළක් එහි විය.

පියයුරු පිළිකාවකට ගොදුරු වූ නයිජීරියානු කාන්තාවකි. පියයුරු වලින් සැරව ගලා යයි. ඇගේ මුහුණ වේදනාවෙන් පිරී තිබිණි. ගුද මාර්ගයේ පිළිකාවක් හට ගත් පුරුෂයෙක් ඉන් පසු පෙනිණ. ඒ තුවාලයෙන් පිටතට පණුවෝ එති. යෝනි පිළිකා, මුඛ පිළිකා රෝගී හුද ප්‍රදර්ශනය වූහ. කලිසම් සහ කමිස ඇඳගත් නයිජීරියානු ජාතිකයෝ කිහිප දෙනෙක් සහ සුද්දෝ කිහිප දෙනෙක් ඉන් පසු ප්‍රදර්ශනය වූහ. ඔවුහු රෝගීන්ට අත තබා අප නොදන්නා බසකින් යමක් කීහ. දෙතුන් දිනක්ම එසේ අත තබා ඔවුහු තොල් මතුළහ. රෝගීහු සුවය ලැබූහ.



සිසිර ජයනාත් රිස්

මගේ සත් ගුණවත් මිත්‍රයා ඉන් පසු මා ඇමතුවේ ය.

"ජයනාත් ඔය රෝගීන් සුව කළේ පාස්ටර් වරු. ඔවුන්ගේ හාස්කම් හරි පුදුමයි."

ඔහු පාස්ටර්ලා රෝගීන් සුවපත් කරන ආකාරය මරණාසන්න රෝගීන් ද නැගිට වූ ආකාරය විස්තර කළේය. මට ඔවුන් පිළිබඳ ගෞරවයක් ද භක්තියක් ද ඇති විය. එදා ඔහු මට රුපියල් 1500 ක් දුන්නේ ය. ගෙදරට මොනව හරි ගෙනියන්නැයි කීවේය.

පසු දින මා ඔහුට දන්තා ලේප නිෂ්පාදනය පිළිබඳව ඇස්තමේන්තුව ඉදිරිපත් කළෙමි. රුපියල් 75,000 ක් ඒ සඳහා අවශ්‍ය විය.

රුපියල් 75000 ක් නෙවෙයි. ජයනාත් වෙනුවෙන් මම රුපියල් ලක්ෂයක් වෙන් කළා. වහාම කර්මාන්තය පටන්ගන්න." ඔහු කීය.

"ජයනාත් දවස් තුනක ගමනක් යන්න තියනවා. ඇඳුම් පිළියෙළ කරගෙන හෙට උදේට එන්න. කැමතිද?"

මා අකමැති වෙන්නෙ කොහොමද? මට යහපත් අනාගතයක් උදාකර දීමට සැරසුණු මගේ සත් ගුණවත් මිත්‍රයා ඔහු ය.

"කැමතියි" මම කීවෙමි.

"එහෙනම් හෙට උදේ අටට මහනුවර මහ තැපැල් කන්තෝරුව ළඟට එන්න" ඔහු කීවේ ය.

මම ඇඳුම් බෑගයක් ගෙන තැපැල් කාර්යාලයේ ඉදිරිපිටට ගියෙමි. දිග බසයක් එතැන විය. මගේ සත් ගුණවත් මිතුරාගේ වෑන් රථය ද එහි විය. සියයකට වැඩි පිරිසක් බසයට නැගුණ හ. මිත්‍රයා මා ඇමතී ය.

"මේ බස් එකේ යන අය හොඳට බලා ගන්න. වියදමක් කරන්න අවශ්‍ය වුණොත් මෙන්න ඒකට රුපියල් 5000 ක්. කාටත් ටිකට් කඩන්න. සල්ලි නැති අය වෙනුවෙන් ඔය මුදල් වලින් ටිකට් ගන්න. මගදි තේ බොන්නත් ඔය මුදල් වියදම් කරන්න. මේක මේ විනෝද ගමනක්."

මා පිළිබඳව මගේ මිත්‍රයා තබා ඇති විශ්වාසය ගැන මම පුදුම වීමි. මේ පිරිස මා හැඳින්වූයේ අලුත් පාස්ටර් කෙනෙකු ලෙස ය.

මා හඳුනන මිතුරෙක් ඒ බසයේ සිටියේ ය. ඔහු පලතුරු වෙළෙන්දෙකි. ඔහු ගේ වෙළෙඳම බිඳ වැටී ණය බර තත්ත්වයකට ඔහු පත්ව සිටියේ ය. වෙළෙඳම යළි පටන් ගැනීමට මගේ අර සත්ගුණවත් මිත්‍රයා ඔහුට රුපියල් 35000 ක මුදලක් දීමට පොරොන්දු වී තිබිණ. ඊට පෙර ඔහු ගේ පල්ලියේ කටයුතුවලට සහභාගි වන ලෙස අර වෙළෙන්දාට ඔහු කීය. ඒ අනුව සති කීපයකට ඒ පල්ලියට ගිය බවත්, මේ යන්නෙ ක්‍රිස්තියානි කඳවුරකට බවත් ඔහු කීය.

"ඒක ස්ථිර පල්ලියක් නොවෙයි. මහනුවර මහ තැපැල් හල් උඩ තට්ටුවක් කුලියට අරගෙන ඉරිදාට විතරක් පවත්වන පල්ලියක්. ලෙඩ රෝග සනීප කරගන්න, විශාල පිරිසක් එනව. බෞද්ධ – හින්දු කතෝලික කවුරුත් එනවා."

බසයේ දී මම කීප දෙනෙකු සමග කතා කළෙමි. එක් තරුණයකු පැමිණියේ ත්‍රිරෝද රථයක් ලබාගැනීමට ය. පිරිහුණු බෑග් කර්මාන්තයක් යළි ඇරඹීමට ආධාර පැතූ තරුණ යුවළක් ද වූහ. ගෙයක් තනා ගැනීමට නිවසට විදුලිය ලබා ගැනීමට පැමිණි දෙදෙනෙක් ද වූහ. කලක් ගත වුව ද තවමත් දරු පල නොලැබුණු ජෝඩු කීපයක් ම වූහ. අන්ධ කොර දෙදෙනෙක් ද වූහ. අනෙක් අය ද විවිධ දේ ලබා ගැනීමේ බලාපොරොත්තු සහිතව පැමිණියෝ වූහ. මගේ අර සත් ගුණවත් මිත්‍රයා මේ සියලු දෙනාටම යම් යම් පොරොන්දු දී තිබිණ.

බසය අප ගෙන ගියේ කුලියාපිටියේ දුම්මලසූරියේ පිහිටි විශාල පොල් වත්තකට ය. එහි නිවාස පහළොවක් පමණ විය. විශාල ගොඩනැගිල්ලක් ද විය. එක් නිවසක දහ දෙනෙකුට පහසුවෙන් නවාතැන් ගත හැකි විය.

මේ කඳවුරට අප ගිය හැටියේම අප ගේ අර සත් ගුණවත් මිත්‍රයා සහ ඔහු ගේ බිරිඳත් තවත් යුවළකුත් අප සියලු දෙනා ගේ ම නම් සහ ලිපිනයන් පොතකට ඇතුළු කළහ. ළමයින් ඇර අනෙක් සියලු දෙනාම ගැහැනු පිරි භේදයක් නැතිව කණ්ඩායම් හතරකට බෙදනු ලැබිණ. කණ්ඩායම් හතරට නම් හතරක් ලැබිණ. නායකයෙක් සහ උප නායකයෙක් පත් වූහ. මම එක් කණ්ඩායමකට නායකයෙක් වීමි. මගේ කණ්ඩායමේ නම ඇදහිල්ල ය. ඉන් පසු අර ගෙවල් වල දහ දෙනා බැගින් නතර කරනු ලැබිණ. අඹු සැමියන්ට එකට ඉන්නට නොලැබිණ. ඔවුන්ට වෙන වෙනම ඉන්නට සිදු විය.

බසයේ දී මට හමු වූ අර පලතුරු වෙළෙන්දාත් මාත් එක කණ්ඩායමකට යාමට සිටියත් අර සත් ගුණවත් පාස්ටර් මිත්‍රයා ඊට ඉඩදුන්නේ නැත. අප දෙදෙනා කුටු කුටු ගාන හැටි ඔහුට පෙනෙන්නට ඇත. කඳවුරට තවත් පාස්ටර්ලා පැමිණියහ. ඔවුහු අපට දේශන පැවැත්වූ හ. ජීවිත වලට වැදගත් වන ඉතා හොඳ කරුණු ද ඔවුහු කී හ. ඒ සියල්ල ම අවසන් වන්නේ ඔවුන්ගේ ආගමට ඒමේ වැදගත්කම පැහැදිලි කරමිනි. සුද්ධ වූ ආත්මයාණන් වහන්සේට එකතු වන ලෙස කියමිනි.

## පිළිම වන්දනාවට පහර

පිළිම වන්දනාවට ඔවුහු සිය දේශන වලින් පහර ගැසූ හ.

“මොකටද ඔය මැටි ගොඩවල් වලට වඳින්නේ”

බෞද්ධ, හින්දු, කතෝලික ආගම්වල ප්‍රතිමා ඔවුන් ගේ ගැරහීමට ලක් විය.

ළමයින්ගේ බැඳ තිබුණු පංචායුධයට යන්ත්‍ර වලට බැණ වැදුණ හ.

“ඔය පිරිත් නූල් වලින් ලැබෙන සෙතේ මොකක්ද “ ඇසූ හ.

“පිරිත් නූල් ගලවලා දනවා” ඔවුහු බල කළහ.

මගේ අර සත් ගුණවත් මිත්‍රයා කලින් බෞද්ධයෙකි. ඔහු දැන් බෞද්ධාගමට පහර ගසයි. එහෙත් ඔහු බුද්ධාගමේ ඇති හේතු ඵල වාදය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, කර්මය පිළිබඳව වචනයක්වත් නොකියයි.

ශුද්ධ ආත්මයාණන් වහන්සේ ගැන භක්තිය ඇති කරගෙන කරන යාඥාවලින් සියලු ප්‍රශ්න විසඳිය හැකි ඔහු නිතර කීවේ ය.

කඳවුරේ සියලු කටයුතු වීඩියෝ ගත කැරිණ. ඒ වීඩියෝ පටි පිට රට යවන බව ද පසුව මම දැන ගතිමි.

උදෑසන දේව මෙහෙයේ දී පාස්ටර් වරයෙක් මගේ දරුවන් ගැන ප්‍රශ්න කළේ ය. මගේ දරුවන් ඉතා හොඳින් ඉගෙනුම ලබා උසස් රැකියාවල යෙදෙන බව මම කීවෙමි.

“අන්න නියම ආශිර්වාදය ලැබූ කෙනෙක්” කියමින් පාස්ටර් ළමයින් නැති කාන්තාවන් ගේ හිසට අත තබන්නැයි මට කීය. ඔහු ගේ නියෝගය අනුව ඒ කාන්තාවන් ගේ හිසට අත තැබුවෙමි. දෑස පියා ගතිමි. පාස්ටර් යමක් කීවේය. දරුවන් ඇති කිරීමට සමත් මගේ ශක්තිය දේව ආශිර්වාදය සමඟ මගේ අත දිගේ ගොස් ඇගේ සිරුරට ඇතුළු වන බව ඔහු කීය. කාන්තාවන් නැගිට්ටේ මහත් සතුටෙනි. කඳවුරේ දී ගැහැනු සමග ඉතා ළඟින් ඇසුරු කිරීමට පිරිමින්ට ඉඩ ලැබිණ. ගෙදරදී නැති නිදහසක් ඔවුන්ට ලැබිණ. මේ නිසා කවුරුත් මහත් සතුටට පත්වූහ.

දේව මෙහෙයක් පවත්වන විට සභාවේ සිටි සමහරු වේදිකාවට එති. දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දෙති.

එක පුද්ගලයෙක් වේදිකාවට නැග මෙසේ කීය.

“මම හලාවත මහවැව කෙනෙක්. ඒ පලාතෙ ලොකු ව්‍යාපාරිකයෙක්. මගේ පවුලේ අඩ දබර තිබුණා. කීප වාරයක් ම මා දිවි නසා ගන්න ගියා. මට ජීවිතේ එපා වුණා. කරන කිසි දෙයක් හරි ගියේ නැහැ. මේ අතර මට පාස්ටර් තුමා හමු වුණා. එතුමා මට දෙවියන් වහන්සේ හඳුන්වා දුන්නා. ඊට පස්සේ මා කරන කියන හැම දේම හරි ගියා. මං දැන් පලාතේ ඉන්න ලොකු පොහොසතෙක්. ලොකු ගෙවල් යාන වාහන තියෙනවා. දැන් සැපවත් ජීවිතයක් මා ගෙවනවා.”

ඊට පසු වේදිකාවට නැගුණේ අන්ධ තරුණයෙකි.

“මගේ නම ලාසරස්. මම හිගා කාල ජීවත් වුණේ. මේ පාස්ටර් තුමා මට දෙවියන් වහන්සේ හඳුන්වා දුන්නා. එතුමා මා දෙවියන් වහන්සේ ළඟට කැඳවා ගෙන ගියා. ගැලවීම ලබා දුන්නා. දැන් මා හිගා කන්නේ නැහැ. රැකියාවක් කරනවා” ඔහු කීවේ ය.

අපට ඇසෙන ජනප්‍රිය ගීතවල තනු අනුව පද යොදා ගී ගයන කණ්ඩායමක් ද විය. ඒවා කතෝලිත පල්ලියේ ඇසෙන සාන්ත හැඟීම් ඇති කරන භක්ති ගීත වලට සමාන නොවේ. අසන අය ඉබේම නැටවෙන (නැගලා යන) ගීතය. ඒවා ගැයෙන විට අත්පුඩි ගසමින් නටන්නට සිදුවේ. ඇත්තටම ඒවා අද නගරයේ ඇති බාල සංගීත සංදර්ශනවලට සමාන ය. බාල – තරුණ – මහලු කවුරුත් එක පොදියට උඩ පනිමින් කෑ ගසති. මේ විකාර නැටුම් දුටු මට සිතුණේ දෙවියෙක් නොවෙයි යකෙක්වත් මෙහි නොඑන බව ය.

මේ නැටුම් ගැයුම් ඇරඹීමට ප්‍රථම පාස්ටර්ලා මෙසේ කියති. “මිනිසුන් ඔය විදියට සතුටු වන විට දෙවියන් වහන්සේ ද

සතුටු වී මිනිසුන ගේ ආත්මය තුළට ආවේශ වෙනවා.”

මඳ වේලාවක් නටන විට වෙහෙසට පත්වන සමහරු සිහිසුන්ව ඇඳ වැටෙති. එවිට පාස්ටර්ලා කෑ ගසති.

“අන්න දෙවියන් වහන්සේ ඔවුනගේ ආත්මයට ඇතුළු වුණා. ඔවුන්ට ගැලවීම ලැබුණා.” වැටුණු අය ඔසවා ගෙන ගොස් දිගා කොට ඔවුන්ට වෙනස් බසකින් පාස්ටර්ලා කතා කරති. එවිට වැටුණු අය නැගිටිති.

“දැන් ඔබ ගැලවිලා. ඔබට දෙවියන් ගේ ආශිර්වාදය ලැබිලා.” පාස්ටර්ලා කියති. නොවැටෙන අයට පාස්ටර්ලා මෙසේ කියති.

“නුඹලා නරඹන්නන් නොවේවා! මේ ස්ථානයේ දී ම දෙවියන් වහන්සේ තුළින් ගැලවීම ලබා ගනිල්ලා.”

මමත් අත්පුඩි ගසමින්, උඩ පනිමින් ගොස් බොරුවට ඇද වැටුණෙමි. මගේ අර මිත්‍ර පාස්ටර් මා ළඟට දිවවිත් මා ඔසවා “දැක්ක ද, මෙයා අදමයි ආවේ. මෙන්න ගැලවිල්ල ලැබිලා. දේව ආශිර්වාදය ලැබිලා.” කීය. ඔහු මා ඔසවාගෙන අඩි කීපයක් දුරට ගොස් බිම තබා පිරිසට මෙසේ කී ය.

“මෙයා දෙවියන් වහන්සේ ගේ විශිෂ්ට නිර්මාණයක්. ඉක්මනින් ම ගැලවුණා. දෙවියන්වහන්සේට, ශුද්ධ ආත්මයාණන් වහන්සේට ස්තුති වේවා! ප්‍රශංසා වේවා! ගෞරව වේවා! හාලේ ලූයියා.” එවිට පිරිස ද ‘හාලේ ලූයියා’ කියමින් කෑ ගසූ හ. එහි දී බිම වැටුණු එකම පිරිමියා මා නිසා මට කාගේත් ගෞරවය හිමිවිය. පාස්ටර් කෙනකු වීමට මා සුදුසු බව ද කීපදෙනෙක් කී හ.

## ගැලවීම

“වෙනස් අයට වඩා ඔබට දේව ආශිර්වාදය ලැබිලා.” ඔහු කීවේ ය. මුල් දින රාත්‍රී මා නිදා සිටින විට උදේ පාන්දර හතරට පමණ යම් කිසිවකු පැමිණ මගේ ඇඟට තට්ටු කරනු දැනිණ.

“නැගිටින්න, උදේ තේ හදන්න තියෙන්නේ. අපි දෙදෙනාට.” ඒ තරුණ කන්තාවකි. මම නැගිට්ටෙමි. “තාම හතර වුණා විතරයි. දැන් මොන තේ ද?” මම ඇසුවෙමි. “එහෙම බෑ. මෙහේ නියමය එහෙමයි.” ඇය කීවා ය. මම ඇය සමඟ පිටත ගියෙමි. එළියේ වූයේ තද අඳුරකි. විදුලි එළිය ඇති තැනක දී මට ඇය සිටින ආකාරය පෙනිණ. ඇය සිටියේ රෑට අඳින දුහුල් ඇඳුම (නයිට්ය) පිටිනි.

“ඔකට උඩින් තව ඇඳුමක් දගෙන එනවා.” මම කීවෙමි. ඇය සිනාසී ඒ මොකටදැයි ඇසුවා ය. “එහෙනම් තේ හදන්න ඕන නැහැ”යි කියමින් ඇය ගියා ය. මගේ අප්‍රසාදය ඇයට පෙනෙන්නට ඇත. ගැහැනු පිරිමි නති වන අවස්ථා මෙහි විය. මීට ඉඩ පහසුකම් ලබා දී තිබිණ.

හොඳට දේව ආශිර්වාදය ලැබුණු තරුණ තරුණියන් බෞතිස්ම කරන තැනක් විය. එතැනට මා තෝරා ගත්තේ නැත. මගේ වයස අවුරුදු 52 කි.

හොර රහසේ එතැන සිදුවන දේ බලා ගැනීමට මට හැකිවිය. තරුණ තරුණියන් පුටුවල හිඳුවති. තරුණයා ඉදිරියෙන්, තරුණියක පසුපසින්, ඇයට පසුපසින් තව තරුණයෙක් මේ ආකාරයට පෙළට ඔවුන් හිඳුවා ඉදිරියෙන් සිටින අය ගේ ගෙල පෙදෙස පිරිමදින්නැයි පාස්ටර්ලා කියති. පිරිමැදීම ඇරැඹේ. එය බොහෝ වේලා තිබේ. ගෙල පමණක් නොවේ පිරිමදින්නේ. පසුව වතුර ටැංකියකට දමා සෝදා ගනිති. ඉන් පසු පාස්ටර්ලා ඔවුන් වෙනුවෙන් යාඥා කරති. ශුද්ධාත්මයාණන් වහන්සේට ස්තුති වේවා! මහිමය වේවා! ප්‍රශංසා වේවා. හාලේ ලූයියා.. කියා කෑ ගසති.

## විනෝද සාගරයක්

ඒ දින තුනම රසවත් ආහාරවලින් යැපෙමින්, නටමින් ගී ගයමින්, දේව මෙහෙයට සහභාගි වෙමින්, ක්‍රීඩාවල ද යෙදෙමින් ගත කළ හැකි විය. ඒ කඳවුර විනෝද සාගරයකි. දින තුන මදි බව සමහරු කියති. මේ සතුට ලැබුණේ ශුද්ධආත්මයාණන් වහන්සේ නිසා යයි කියති.

ඒ දින තුන අවසානයේ මට මහනුවර මහ තැපැල් කාර්යාලයේ උඩ තට්ටුවේ ඇති ෆයර් වර්ෂිප් දේවස්ථානයට ඉරිදා දිනවල එන්නැයි අර පාස්ටර් මිත්‍රයා කීය. ඊළඟ ඉරිදා මම එහි ගියෙමි. ඔහුට මගේ දන්තාලේප නිෂ්පාදනය ගැන අමතක ය. මම ඔහු ගේ නිවසට ද ගියෙමි.

“රෝගීන් කීප දෙනකු ඉන්නවා සුවපත් කරන්න. එන්න මා සමඟ යන්න.” ඔහු මට කතා කළේ ය. මම ගියෙමි.

ගෙවල් කීපයකට ගියෙමු. දිනක් අපි පිළිකා රෝගියකු සුව කිරීමට ගියෙමු. පිළිමතලාවේ නිවසක සිටි පිළිකා රෝගියකු වූ ඒ කාන්තාව මා යන විට සිටියේ වේදනාවෙන් කෙඳිරි ගාමිනි. පාස්ටර් ගේ නියමය පරිදි මම ඇගේ හිසට අත තබා යාඥා කළෙමි. අඩ පැයකට පසුව ඇය සුවපත් වූවාය.

පසු දිනෙක මම තනියම පිළිමතලාවට ගියෙමි. ඒ නිවසේ පිළිකා රෝගියා ගැන අසල්වැසියකු ගෙන් විමසීමි.

“ඒ ගෙදර එහෙම ලෙඩෙක් නැහැ.” අසල්වැසියා කීය. මම තවත් තොරතුරු සොයා ගතිමි.

ඒ බෞද්ධ නිවසකි. ඒ නිවසේ එක් තරුණියක් පාස්ටර්ලා ගේ ආගම වැළඳ ගත්තා ය. ඇගේ නැන්දට පිළිකාව වැළඳී ඇති බව පවසා බොරුවක් ගෙතුවේ මා රැවටීමට ය. අර පාස්ටර් මිත්‍රයා එසේ කළේ මා ලෙඩුන් සුව කිරීමේ සමතකු ලෙස මා තුළ ම විශ්වාසයක් ගොඩ නැංවීමට ය. මා පාස්ටර් කෙනෙකු කිරීමට ය.

## බුදු සාදුට වඳින්න එපා

දිනක් මම පාස්ටර්ලා පවත්වන ළදරු පාසලකට ගියෙමි. තරුණ ගුරුවරිය ළමයින් ගෙන් මෙසේ ඇසුවා ය.

“මේ පුතාලා අම්මට ආදරේ ද?”

“ඔව්” ළමයි කීහ.

“අම්මත් පුතාලට ආදරේ ද?”

“ඔව්”

“තාත්තට ආදරේ ද?”

“ඔව්”

“තාත්තත් පුතාලාට ආදරේ ද?”

“ඔව්”

“හොඳයි. ඒ තාත්තා පුතයි අම්මයි දාලා ගියොත්.”

“නැහැ. එහෙම වෙන්නේ නැහැ.”

“හොඳයි. එහෙම වුණොත්.”

“අපේ තාත්තා අපි දාල යන්නේ නැහැ.”

“මේ පුතාල පන්සල් ගිහිල්ලා තියෙනව ද?”

“ඔව්”

“පන්සලේ විහාරේ කවුද ඉන්නේ.”

“බුදු සාදු”

“බුදු සාදු බුදු වෙන්න කලින් නම සිද්ධාර්ථ. ඔය ගොල්ලෝ ඒක දන්නව ද?”

“ඔව්”

“සිද්ධාර්ථ බුදු වෙන්න ආවේ ඔය පුතාලා වගේ පුංචි පුතෙකුයි අම්මයි තනි කරලා දාලා. ඒක හොඳ වැඩක් ද?”

“නැහැ”

“එහෙනම් ඔය බුදු සාදු හොඳ කෙනෙක් ද?”

“නැහැ. නරක කෙනෙක්”

“බුදු සාදු නරක කෙනෙක් ද?”

“ඔව්”

“ඇයි. එහෙනම් වඳින්නේ?”

“අපි තවත් වඳින්නේ නැහැ.”

මම තවත් ළදරු පාසලකට ගියෙමි.

ගුරුවරිය ළමයින්ට පෙට්ටි තුනක් ඉදිරිපත් කළාය.

“පළමුවැනි පෙට්ටිය ඇරලා බලන්න.” ඇය කීවා ය. ළමයි එය විවෘත කළ හ. එය හිස් පෙට්ටියකි.

“මොනවද තියෙන්නේ?”

“මුකුත් නැහැ.”

“ඊ ළඟ පෙට්ටිය බලන්න.”

“ළමයි දෙවැනි පෙට්ටිය විවෘත කළහ.” එය ඇතුළට අත දමා බැලූ හ.

“මොනවද තියෙන්නේ”

“මේ. බුදු සාදු ගේ පින්තූරයක්.”

“එච්චර ද තියෙන්නේ.”

ඔව්.”

"ඒ ළඟ පෙට්ටිය අරින්න."
ළමයි ඒ පෙට්ටිය ද ඇර බැලූ හ.
"මොනවද තියෙන්නේ."
ළමයි පිළිතුරු දුන්නේ ප්‍රීතියෙනි.
"සෙල්ලම් බඩු තියෙනවා. නළා, පුංචි කාර්, මල්, පුංචි බෝනික්කෝ."
"තව ඇතුළට අත දලා බලන්න."
"මේ ඉන්නෙ ජේසු බාබා."
ළමයි ජේසු බාබාගේ පින්තූරයක් පිටතට ගතිති.
"පෙට්ටි තුනෙන් පළමුවැනි පෙට්ටියේ මොනවද තිබුණේ?"
"මුකුත් නැහැ."
"දෙවෙනි පෙට්ටියේ?"
"බුදු සාදු හිටියා."
"ඒකේ සෙල්ලම් බඩු තිබුණා ද?"
"නැහැ."
"තුන්වෙනි පෙට්ටියේ?"
"සෙල්ලම් බඩු තිබුණා. ජේසු බාබාත් හිටියා."
"එහෙනම් මේ පුතාල කැමැති බුදු සාදු ඉන්න තැනට ද? ජේසු බාබා ඉන්න තැනට ද?"
"ජේසු බාබා ඉන්න තැනට."
"අන්න හරි අපි ඉන්න ඕන ජේසු බාබා එක්ක. හොඳයි මීට පස්සේ ඔය ගොල්ලෝ පන්සල් යනව ද?"
"නැහැ."
"ඇයි?"
"බුදු සාදු ළඟ සෙල්ලම් බඩු නැහැ."
"එහෙනම් ඔය ගොල්ලෝ කොහේද ඉන්න ඕන."
"ජේසු බාබා ඉන්න තැන."

බෞද්ධ පවුල්වල කුඩා දරුවන්ගේ සිත් තුළින් 'බුදු සාදු' ඉවත් කොට 'ජේසු' බාබාට ඉඩ ලබාදෙන ළදරු පාසල් ගුරුවරියන්ට, පාස්ටර්ලා අත දිග ඇර තෑගි දෙති.

ඔවුන් නොදියුණු ගම්මානවල ඇරැඹූ හැම ළදරු පාසලක්ම සූක්ෂම ලෙස බෞද්ධ ළමයින් අබෞද්ධ කරන හැටි මට දක්නට ලැබිණ.

දිනක් මට මහනුවර නගරයේ දී ස්වීප් ටිකට් විකුණන අර අන්ධ ළමයා හමුවිය. ඔහු ගේ නම ලාසරස් ය. ලාසරස් යනු බයිබලයේ එන නමකි. එය බොරු නමක් බව එදු දුම්මලසූරියේ දී ම මට වැටහිණ.

මම එකවරට ම ලාසරස් ගේ කමිස කොලරයෙන් අල්ලා ගතිමි. "ඇත්ත කියාපිය. තෝ ලාසරස් නොවෙයි. තොගේ නම මොකක්ද? මං පොලිසියෙන්."

ඒ අන්ධයාට මා හඳුනා ගත නොහැකි ය. මම ඔහු ගේ ගෙළ තද කළෙමි. ඔහු ගේ දෑසට කඳුළු නැඟිණ.

"ඇත්ත කියන්නම්."
"උඹේ නම මොකක්ද?"
"මම රත්නසූරිය බණ්ඩාර. මම හැම ඉරිද ම පාස්ටර් එක්ක පල්ලියට යනවා. එතනට ගිහින් දෙවියන් වෙනුවෙන් සාක්කි දෙනවා. මට දෙවියන් යහපතක් කළා ය කියනවා. මට ඒකට සල්ලි ලැබෙනවා. ඔහු කීය.

## සත්‍යය කුමක් ද?

ඉරිද මහනුවර වර්ෂිප් දේවස්ථානයටත්, තවත් දේවස්ථාන කිහිපයකටත් ගොස් බැතිමතුන් ඉදිරියේ සාක්ෂි දෙන 'උමතු' තරුණයකු ගෙන් ද ඇත්ත හෙළිකර ගැනී–මට මට හැකිවිය.

ඔහුගේ නම නෙවිල් ය. ධීවර තරුණයෙකි. එක් කණ්ඩායමක් ඔහු බලයෙන් මානසික රෝහලට ගෙන ගියහ. ඔහු සුව කිරීමට පාස්ටර්වරු ගිය හ. මගේ මිත්‍ර පාස්ටර් ඔහුගේ ගෙදරට ගොස් ඔහු වෙනුවෙන් යාඥා කළේ ය.

පසුව ඔහු දේවස්ථානවලට ගෙන ගිය පාස්ටර්ලා ඔහු ලවා කතාවක් කියැවූහ.

"මා පිස්සෙක්. අංගොඩත් හිටියා. මට ශුද්ධ වූ ආත්මයාණන් වහන්සේ කරුණාව පෙන්නුවා. මේ පාස්ටර් තුමා අපේ ගෙදරට ඇවිත් යාඥා කරලා මා සුවපත් කළා. ශුද්ධ වූ ආත්මයාණන් වහන්සේට ස්තුති වේවා."

නෙවිල් ගෙන් මම ප්‍රශ්න කළෙමි.

"මට පිස්සුවක් නැහැ. අපේ පැත්තේ දේශපාලනඥයෙක් තමයි මං මුන්ට අල්ලල දුන්නේ. සල්ලි ලැබෙන නිසා මං උන් කියන කතාව කියනවා." ඔහු කීවේ ය.

මේ පාස්ටර්ලා ගම්මානවල දුප්පත් පවුල් සොයා යති. යකුන් ප්‍රේතයන් පළවා හරින බව කියා බෞද්ධයන් මුලා කරති.

දිනක් මම මගේ අර පාස්ටර් මිත්‍රයා සමඟ නත්තරම්පොත දේවස්ථානයට ගියෙමි. එය කුරුසියත් සහිත සාමාන්‍ය ගෙයකි. එද එතැනට විශාල පිරිසක් පැමිණ සිටියහ. කොරියාවේ සිට පැමිණි දෙමළ ජාතික පාස්ටර් වරයෙක් ද දෙමළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් ද ඊට සහභාගි වූහ.

එද එහි පැවැත්වූයේ තුන් අවුරුදු සංවත්සරයකි. ඒ දෙමළ පාස්ටර් කතා කළේ කෝපයෙනි.

## බෞද්ධ ගම් 65000 ක ඉලක්කයක්

"බෞද්ධ ගම්මාන 65000 ක් අපේ ආගමට හරවා ගන්න බලාපොරොත්තු වුණත් තාමත් නුඹලට පුළුවන් වී ඇත්තේ ගම් 8000 කට යාමට පමණයි. ආගම් ප්‍රචාරය ඉතා දුර්වලයි. අප සේවය කරන කොරියාව දෙස බලාපල්ලා. ඉස්සර බෞද්ධයන් ගේ රටක් ඒ. අද බේතකට ගන්න බෞද්ධයෙක් නැහැ. මෙහෙත් එහෙම වෙන්න ඕනැ. කොරියාව දේව රාජ්‍යයක් වෙනවා. ලංකාවත් දේව රාජ්‍යයක් බවට පත් කරන්න ඕනැ. ඔහු කීවේ ය.

පළාත් සභා මන්ත්‍රීවරයා පල්ලියක් ගොඩ නැඟීමට ඉඩමක් ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කළේ ය.

හින්දු, කතෝලික ආගම්වලටත් විරුද්ධව කතා කළත්, මේ සංවිධානයේ වැඩි අවධානය බෞද්ධ ගම්මාන අබෞද්ධ කිරීමට යොමු වී ඇති බව මට පෙනිණ.

"මට තොපේ දත්තාලේප කර්මාන්තය එපා. මම මේ මිථ්‍යා දෘෂ්ටි ව්‍යාපාරයට එරෙහිව සටන් වදිනවා.යි සිත දැඩි කරගෙන මහනුවර බෞද්ධ නායකයන්ට මම මේ සියලු තොරතුරු හෙළි කළෙමි.

මගේ වෙනස්වීම දුටු, මා ඔවුන් මග හැර යනු දුටු අර මගේ මිත්‍ර පාස්ටර් මා ලුහු බැන්දේ ය. මගේ නිවසට පැමිණියේ ය.

උපතින් බෞද්ධයකු වූ ඔහු අතිවිශාල ධනයක් විදේශ ආගමික ආයතනයකින් ලබා ගනිමින් බෞද්ධ ආගම විනාශ කිරීමට ගෙන යන කුට උපායට එරෙහිව මම කතා කළෙමි. ඔහු මට තර්ජනය කළේ ය.

"අපේ උදව්ව නිසා සරු වුණු මැරයන් සිටිනවා. උන්ගෙන් නුඹට දඬුවම් ලැබේවි." ඔහු කීවේ ය.

"කමක් නැ. මම මගේ ආගම විකුණන්නේ නැහැ. මම මරණයට බය නැහැ." මම කීවෙමි.

ඔහු මිදුලට බැස "ශුද්ධ වූ ආත්මයාණන් වහන්ස මොහුට සාප කරන මැනවි"යි කීවේ ය.

ගංගොඩවිල සෝම හිමියන් ගේ අපවත්වීමෙන් පසු ඔවුන් මඳක් නිශ්ශබ්දව සිටින බව පෙනුනත් වහා වැඩ අරඹනු ඇත.

ඉන්දියානු මහාචාර්ය ලක්ෂ්මි නරසු ගේ මේ ප්‍රකාශය මෙතැනට උචිත යයි මම සිතමි.

"ආගම් උමතුවෙන් තොර එකම ආගම වශයෙන් සැලකිය හැක්කේ බුදු සමය පමණි. බුදු සමයේ හරය නම් ආත්ම විජයයෙන් ආධ්‍යාත්මික විප්ලවයක යෙදෙන පුද්ගලයන් බිහි කිරීමයි. ඒ නිසා සිය ආගමට මිනිසුන් හරවා ගැනීම පිණිස බුදු සමය මිල මුදල් හෝ පොළඹවාලීම් හෝ බලය හෝ භාවිතා නො කරයි. බුදුරජාණන් වහන්සේ විමුක්ති මාර්ගය පෙන්නු සේක. ඒ මග ගමන් ගැනීමට තීරණය කිරීම එක් එක් පුද්ගලයාට අයත් කාර්යයකි."

බුද්ධ ධර්මය ප්‍රචාරය වූයේ යහපත් සංවාදයෙනි. වංචාවෙන් නොවේ.

"එන්න. බලන්න. හොඳනම් ගන්න." යන බුද්ධ ධර්මයේ 'එහි පස්සිකෝ ගුණය' අපි දනිමු. යම් යම් වාසි ලබා ගැනීමට, බොරු යාඥාවලට නොරැවටෙන මෙන් මම බෞද්ධ ජනයාගෙන් ඉල්ලමි.

***– සිසිර ජයනාත් පීරිස්, 65/1, උඩුවල පාර, අම්පිටිය, මහනුවර***